දර්ශන

233

# ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සමාජ තොරතුරු ගවේෂණයෙහි ලා ජනශ්‍රැතියෙන් ලබාගත හැකි පිටිවහල

## (ශ්‍රී ලංකාවට විශේෂ වූ පුරාකතා පිළිබඳ අවධානයකින්)

ලියාපදිංචි අංකය : H / Ph.D / Sin / 98 / 08



| ප්‍රවේශ අංකය | 233 |
| --- | --- |
| වර්ග අංකය | |



කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ සිංහල දර්ශන විශාරද උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2001 නොවැම්බර්

## සාර සංග්‍රහය.

ජනශ්‍රැති විද්‍යාව ලොව සියලු මානව කණ්ඩායම්වලට පොදු වූ පුළුල් ලෙස පැතිරී ගිය විෂය ක්ෂේත්‍රයකි. එය අධ්‍යයනයේ පහසුව තකා කුඩා අනු කොටස්වලට බෙදා වර්ගීකරණයන්ට ලක් කරනු ලැබුව ද සමස්තයක් ලෙස ජනශ්‍රැතියෙහි ගැබ් වී ඇත්තේ සාම්ප්‍රදායික ඥානයයි. එබඳු පුළුල් විෂය ක්ෂේත්‍රයක් වන ජනශ්‍රැති විද්‍යාවේ ඉතා කුඩා අනුකොටස් කිහිපයක් සීමාව කොට ගෙන ඓතිහාසික හා සමාජ තොරතුරු ගවේෂණයේ දී ජනශ්‍රැතිවලින් ලබාගත හැකි තොරතුරුවල විශ්වසනීය භාවය පිළිබඳ වූ ගැටලුව නිරාකරණය කර ගත හැකි මාර්ග පිළිබඳ අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලට ගොස් ඒ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගෙන් එම ප්‍රදේශ අරභයා මුඛ පරම්පරාගතව එන විවිධ පුරාකතා හා අනුශ්‍රැති එකතු කර ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ දී සිදු කොට ඇත. එයට අමතරව මූලාශ්‍රය ග්‍රන්ථ වශයෙන් ලංකාවේ නිල ඉතිහාස ග්‍රන්ථය ලෙස සැලකිය හැකි මහාවංශයෙන් ද තොරතුරු උපුටා ගැනිණි. ප්‍රාග් විජය යුගයේ සමාජය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමේ දී භාරතීය වීර කාව්‍යයක් වූ රාමායණය ද එය මූලාශ්‍රය කොට ගෙන කුමාරදාස රජු විසින් රචිත ජානකීහරණය ද බෙහෙවින් උපයෝගී කර ගැනිණි. සිංහල ජනයාගේ ඉතිහාසය හා සම්බන්ධ පුරාකතා ආදිය ඉදිරිපත් කරන ශ්‍රී ලංකාවේ ඉපැරණි ශාන්තිකර්මයක් ලෙස සැලකිය හැකි කොහොඹා කංකාරියේ අන්තර්ගත තොරතුරු ද අධ්‍යයනය සඳහා උපයෝගී කොට ගෙන ඇත.

විජයාගමනය හා සිංහල ජාතියේ ආරම්භය සිදු වූ ආකාරය පිළිබඳ වංශකතාවන්හි එන පුවත ආශ්‍රය කොට ගොඩ නැගී ඇති පුරාකතා ද එම සිදුවීමට පෙර යුගය හා එයට පසු දුටුගැමුණු රාජ්‍ය සමය දක්වා කියැවෙන ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික, ග්‍රන්ථාගත හා ජනශ්‍රැති පුවත් පාදක කොට ගෙන

ප්‍රාග් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකා වාසී ස්වදේශීය ජනතාවගේ සමාජ තොරතුරු මෙම අධ්‍යයනය මගින් ඉදිරිපත් කිරීමට උත්සාහ දරිණි.

ස්වදේශීය ජනතාවගේ දියුණු ශිෂ්ඨාචාරයක වූ සාමකාමී සමාජය විජයාගමනයත් සමග කැලඹීමට පත්විය. එසේ වුවත් විදේශිකයින්ගේ ආධිපත්‍යයට යටත් වූයේ දිවයිනේ කොටසක් පමණි. එයින් පසු ආක්‍රමණිකයින් හා ස්වදේශීය ජනතාව අතර නිරන්තර ගැටුම් ඇති විය. මෙම දෙපිරිස අතර යම් සහයෝගීතාවක් ඇතිවීමට වෙනත් විදේශීය බලවේගයක් ඉවහල් විය. ඉනික්බිතිව පැවති දේශීය සංස්කෘතිය සමග විදේශීය සංස්කෘතිය සුසංයෝගවීම ඇරඹිණි. එබැවින් ස්වදේශීය සමාජයේ පැවති සංස්කෘතික ලක්ෂණ පරිවර්තනයට ලක් වූ නව සමාජයේ සිරිත්-විරිත්, ඇදහිලි හා කලා නිර්මාණ මෙන් ම දියුණු තාක්ෂණික උපකරණ හා වාස්තු විද්‍යාත්මක නිර්මාණවලින් ද ඉස්මතුව දක්වෙන බව මෙම අධ්‍යයනයේ ප්‍රධාන නිගමන ලෙස ඉදිරිපත් කොට ඇත.